# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,793 — 1961 දෙසැම්බර් 2 වැනි සෙනසුරාද — 2.12.1961

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### ප්‍ර කා ශ න ය යි

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බොඩ සහ කිනිගොඩ කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයට අයත් ගල්බොඩ කෝරළේ අංක 21 දරණ කඩිගොමුව වසම සහ කිනිගොඩ කෝරළේ අංක 9 දරණ කිරිවන්දෙනිය වසම යන සීමාවන් තුළත්, පරණකූරු කෝරළේ අංක 47 ඒ දරණ දෙබත්ගම වසම සීමාව තුළත්, වසූරිය රෝගය පවතින බැවින් කෑගල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි තැන්පත් සෙල්ලයියා විවේකනන්දරාජා වන මම, 1954 සැප්තැම්බර් මස 17 වැනි දින අංක 10,713 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙන් සංශෝධනය කරන ලද 1925 අගෝස්තු මස 28 වැනි දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශ කළ නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥාපනත (173 වැනි අධිකාරය) ප්‍රකාර මා වෙත පැවරී ඇති බලය පරිදි යට දැක්වෙන උපලේඛනයේ සඳහන් කොට්ඨාශ ලෙඩ පවතින ප්‍රදේශ වශයෙන් මෙයින් ප්‍රකාශ කරමි.

2. මෙම ප්‍රකාශනය 1961 නොවැම්බර් 27 වැනි දින දවල් 12 සිට නැවත අවලංගු කරන තුරු බල පැවැත්වෙයි.

3. රෝගය පැතිරී ඇති ඉහත සඳහන් ස්ථානයට යාමටත්, එහි සිට පිටත්වීමටත් පෙර සෑම දෙනාම සතුටුදායක ලෙස අත් එන්නත් කරගත යුතුවාක් මෙන්ම මෙම නිවේදනය ප්‍රකාශ කළ දිනට පෙර තුන්මාසයක් තුළදී අත් එන්නත් කළ බවට සළකුණු ද දැක්විය යුතු ය.

සෙල්ලයියා විවේකනන්දරාජා,
කෑගල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී.

1961 නොවැම්බර් 27 වැනිද,
කෑගල්ලේ සෞ. සේ. අධිකාරි කාර්යාලයේ දීය.

### උපලේඛනය

අංක 21 දරණ කඩිගමුව වසම.—කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බොඩ සහ කිනිගද කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයට අයත් ගල්බොඩ කෝරළේ ගොන්දිවෙල, හලගිරිය, කඩිගමුව, මාපිටිය, මීවිලිකෙ, කෙම්පිටිය, මෝදර තැන්න, නැටියපාන සහ උඩුගම යන ගම්වලින් සමන්විත වූ සම්පූර්ණ ප්‍රදේශය, සහ

අංක 9 දරණ කිරිවන්දෙනිය වසම.—එම ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයටම අයත් කිනිගද කෝරළේ කපුරු ගම්පොල, කිරිවන්දෙනිය, කොරිගම්මාන, කොටගම, කොට්ටන්වත්ත, මලකපිය, මුවපිටිය, ඕවත්ත සහ යෝධගම යන ගම්වලින්, සමන්විත වූ සම්පූර්ණ ප්‍රදේශය.

අංක 47 ඒ දරණ දෙබත්ගම වසම.—කෑගල්ල දිස්ත්‍රික්කයේ පරන්කුරු කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයට අයත් උඩබාගේ, පල්ලෙබාගේ සහ කළුගල යන ගම්වලින් සමන්විත වූ සම්පූර්ණ ප්‍රදේශය.

12-292


ලංකාවේ වැලව්වේනයෙහි පිහිටි "ඊස්ටන් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයයේ මුද්‍රාපිතයි.

2195—ජෙ. ඇන්. ඇර් 226—5,300 (12/61)